// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 2298/48 - 2022 සැප්තැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2022.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ඇ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල හා 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය අනනුකූල කරමින් ඌව පළාත තුළ පිහිටුවා ඇති පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම සඳහා වූ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හා ඊට අදාළ හෝ අනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා පනවා ඇති ඌව පළාතේ පළාත් සභාවේ 2011 අංක 2 දරන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ 2011 අංක 2 දරන ප්‍රඥප්තියේ 2(3)(අ)(III) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාත් ආණ්ඩුකාරවර ඒ. ජේ. එම්. මුසම්මිල් වන මා, කතරගම ප්‍රාදේශීය සභාවේ කටයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2279/10 හා 2022.05.09 දිනැති *අති විශේෂ ගැසට්* නිවේදනය මගින් එදින මධ්‍යම රාත්‍රියේ සිට ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවීමට කටයුතු කරන ලදී.

තවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2279/10 හා 2022.05.09 දිනැති *අති විශේෂ ගැසට්* නිවේදනය මගින් එකී ප්‍රඥප්තියේ 2(1) වන උප වගන්තියේ (අ), (ආ), (ඇ) හා (ඉ) වගන්තිවල සඳහන් කරුණු කිසිවක් කතරගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිවරයා ඇතුළු සභාව විසින් සිදුකර ඇත්තේ ද යන්න පිළිබඳව පරීක්ෂා කොට මා වෙත වාර්තා කිරීම සඳහා අධිකරණ නිලධාරි, විශ්‍රාමලත් අධිකරණ විනිසුරු එච්. එම්. ආර්. අනුර කුමාර මහතා පත් කරන ලදී.

විශ්‍රාමලත් අධිකරණ විනිසුරුගේ අදළ පරීක්ෂණ වාර්තාවේ කරුණු සම්බන්ධව මා පෞද්ගලිකව කියවා බලා සෑහීමට පත්වූ අතර 2022.09.22 දින මධ්‍යම රාත්‍රියේ සිට කතරගම ප්‍රාදේශීය සභාව විසුරුවා හැරීමට තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

1A - PG 5978 — 08 (2022/09)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

එසේම උක්ත ප්‍රඥප්තියේ 5 වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022.09.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි අලුත් ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කරන තෙක් හෝ නැවත නියමයක් කරන තෙක් ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ කතරගම ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට හා කාර්යය ඉටු කිරීමට මොණරාගල සහකාර පළාත් පාලන කොමසාරිස්වරයාට මෙයින් නියෝග කරමි.

**ඒ. ජේ. එම්. මුසම්මිල්,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2022 සැප්තැම්බර් මස 21 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 09- 0241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.